# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 2019 අංක 11 දරන ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථා (සංශෝධන) පනත

---

**[සහතිකය සටහන් කළේ 2019 ජූනි මස 28 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

2019 ජූනි මස 28 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකි ය.

**මිල :** රු. 8.00 **තැපැල් ගාස්තුව :** රු. 15.00

මෙම පනත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## 2019 අංක 11 දරන ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථා (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2019 ජුනි මස 28 වන දින]

එල්.ඩී.— ඕ. 54/2018

**1968 අංක 15 දරන ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථා පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**1.** මේ පනත 2019 අංක 11 දරන ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථා (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ලුහුඬු නාමය.

**2.** (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1968 අංක 15 දරන ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථා පනතේ දීර්ඝ නාමයේ "ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාව" යන වචන යෙදෙන සෑම ස්ථානයකම, ඒ වෙනුවට "ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව" යන වචන ආදේශ කිරීමෙන් එකී දීර්ඝ නාමය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

1968 අංක 15 දරන පනතේ දීර්ඝ නාමය සංශෝධනය කිරීම.

**3.** (1) ප්‍රධාන ප්‍රඥප්තියේ සහ වෙනත් යම් ලිඛිත නීතියක "ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාව" යන වචන යෙදී ඇති සෑම ස්ථානයකම ඒ වෙනුවට "ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව" යන වචන ආදේශ කරනු ලැබිය යුතු ය.

ප්‍රධාන ප්‍රඥප්තියට සහ වෙනත් ලිඛිත නීතිවලට වූ පොදු සංශෝධනය.

(2) සෑම නිවේදනයක, දැන්වීමක, කොන්ත්‍රාත්තුවක, සන්නිවේදනයක හෝ වෙනත් ලේඛනයක ඇති "ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාව" සම්බන්ධයෙන් වන සෑම යෙදුමක්ම "ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව" යන වචන සඳහන් කරන ලද යෙදුමක් ලෙස කියවා තේරුම්ගත යුතු ය.

**4.** සැක දුරුකිරීම සඳහා "ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව" සියලු කාර්ය සඳහා "ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාව" යන්නෙහි අනුප්‍රාප්තිකයකු ලෙස සලකනු ලැබිය යුතු ය.

සැක දුරුකිරීම.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**5.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත්, අංක 118, දෙස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08,
රජයේ මුද්‍රණාලයේ පිහිටි "ප්‍රකාශන පියස" හි දී මිල දී ගත හැකි ය.